# Abstract No 68

## දෘශ්‍යකාව්‍යයෙහි නායිකාවගේ භූමිකාව පිළිබඳ විමර්ශනයක්

**ආර්.පී. අප්සරා සඳමාලි**
සිංහල විශේෂවේදී (තෙවන වසර), සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
apsarasandamali314@gmail.com

දෘශ්‍යකාව්‍ය පාත්‍ර වෘන්දය අතර ස්ත්‍රී චරිත බහුල ව හමු වේ. අපරදිග නාට්‍යයන්හි ස්ත්‍රී චරිත සඳහා පුරුෂයන් ම රංගනයෙහි නිරත වී ඇත. එහෙත් පෙරදිග - සංස්කෘත දෘශ්‍යකාව්‍යයන්හි ස්ත්‍රී රංගනයන් කාන්තාවන් විසින් ම රඟ දක්වා ඇත. සම්භාව්‍ය සංස්කෘත දෘශ්‍යකාව්‍යයන්හි නායිකා චරිත නිරූපණය ඒකස්වරූපී නොවේ. මාලවිකා ගායනයෙහි නිපුණ සොඳුරු යුවතියකි. ඌර්වශී දිව්‍ය අප්සරාවකි. ශකුන්තලා අසපුවක හැදී වැඩුණු කාන්තාවකි. වසන්තසේනා වෘත්තියෙන් වෛශ්‍යාවකි. බොහෝමයක් කථා නායිකාවෝ රාජදුහිතෘහු ම වෙති. ඌර්වශී හා ශකුන්තලා වැනි දිව්‍ය අප්සරාවන් ද ඒ අතර වේ. භරත මුනිවරයාගේ නාට්‍යශාස්ත්‍රය, ධනංජය පඬිවරයාගේ දශරූපය හා විශ්වනාථයන්ගේ සාහිත්‍යදර්පණ යන සාහිත්‍ය මූලාශ්‍රයන්හි කථානායිකා භූමිකාවට අදාළ සිද්ධාන්ත සංග්‍රහ වේ. ක්‍රි: ව: දෙවන ශතවර්ෂයෙහි රචනා වන නාට්‍යශාස්ත්‍රයෙහි ප්‍රධාන නායිකා ප්‍රභේද හතරක් හමු වේ. දහවන ශතවර්ෂයේ පමණ රචිත දශරූපයෙහි නායිකා ප්‍රභේදත්‍රයක් පිළිබඳ සාකච්ඡා කෙරේ. සාහිත්‍යදර්පණයෙහි නායිකා පාත්‍රවර්ගයා පිළිබඳ විශ්ලේෂණාත්මක විවරණයක් හමු වේ. සමස්ත කථානායිකා ප්‍රභේද දහ අටක් පිළිබඳ ව සඳහන් වේ. නාට්‍යයක කථානායක චරිතය පිළිබඳ විවිධ පර්යේෂණයන් සිදු කර ඇතත්, කථානායිකාවගේ භූමිකාව පිළිබඳ ව ප්‍රාමාණික ගවේෂණයන් විරල ය. මූලාශ්‍රයානුසාරී ව සංස්කෘත දෘශ්‍ය කාව්‍යයෙහි නිරූපිත කාන්තාවගේ භූමිකාව කවරාකාර වූයේ දැයි ගවේෂණය කිරීම මේ පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වේ.

**ප්‍රමුඛ පද :** කථානායිකාව, දෘශ්‍යකාව්‍ය, ස්ත්‍රීචරිත, සංස්කෘත